තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
කාමර අංක 203 සහ 204
දෙවන පරිශ්‍රය
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
බෞද්ධාලෝක මාවත
කොළඹ 07

අභියාචන පෝරමය

01. අභියාචකගේ නම - නීතිඥ උදය ගම්මන්පිල

02. ලිපිනය - අංක 448, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

03. දුරකථන අංකය - 071-8220451

04. විද්‍යුත් ලිපිනය - udaya.gammanpila@ymail.com

05. බලයලත් නියෝජිතයාගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර -

නම - කවින්ද්‍යා මදුෂන්කි ෆොන්සේකා

06. ලිපිනය - අංක 448, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

දුරකතන අංකය - 071-0802666
විද්‍යුත් ලිපිනය - kavindyamadushanki@gmail.com

07. අදාළ පොදු අධිකාරයේ නම - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

08. අදාළ තොරතුරු නිළධාරියාගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර -

නාම - හංස අබේරත්න මහතා
ලිපිනය - පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
දුරකතන අංකය - 011-2777100 දිගුව 2162
විද්‍යුත් ලිපිනය - informationofficer@parliament.lk

09. තොරතුරු නිළධාරියාට තොරතුරු ඉල්ලීම කළ දිනය සහ ලියාපදිංචි අංකය -

දිනය - 2025 ඔක්තෝම්බර් මස 31 වන දින
ලියාපදිංචි අංකය - PS/RTI/RTI 05/25/0195

10. තොරතුරු නිළධාරියාගේන් ඔබට පිළිතුරක්/ ප්‍රතිචාරයක් ලැබුණාද? ඔව්

11. තොරතුරු නිළධාරියාගේ තීරණය ලැබුණු දිනය - 2025 නොවැම්බර් මස 15 වන දින

12. එම තීරණයට විරුද්ධව අභියාචනය කළ නිළධාරිගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර -

නම - කුෂානි රෝහණදීර මහත්මිය
ලිපිනය - පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
දුරකතන අංකය - 011-2777100 දිගුව 2160/2164
විද්‍යුත් ලිපිනය - sgp@parliament.lk

13. නම් කළ නිළධාරියාට අභියාචනය සිදුකළ දිනය සහ අභියාචන අංකය -

දිනය - 2025 නොවැම්බර් මස 26 වන දින
අභියාදන අංකය - PS/RTI/RTI 08/25/0042

14. නම් කළ නිළධාරියාගෙන් ඔබට තීරණයක් ලැබුණේද? ඔව්

15. නම් කළ නිළධාරියාගෙන් ඔබට තීරණය ලැබුණු දිනය - 2025 දෙසැම්බර් මස 19 වන දින

16. අභියාචනය කිරීමේ පදනම - වාර්තාවේ පිටපතක් මට ලබා දීමෙන් පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සතු කිසිම වරප්‍රසාදයක් හෝ බලතලයක් හීන නොවන බව සහ උල්ලංඝණය නොවන බව

17. අභියාචනයේ දී ඉල්ලා සිටි තොරතුරු - “පාර්ලිමේන්තුවට අදාළ රහස්‍ය තොරතුරු අවසරයකින් තොරව මාධ්‍යයට හෙළිදරව්වීම සම්බන්ධයෙන් සහ ගරු කතානායකවරයාගේ නිල නිවාසය පිළිබඳ රහස්‍ය තොරතුරු තෙවැනි පාර්ශවයකට හෙළිදරව් වීම සහ එම තොරතුරු මාධ්‍ය මගින් ප්‍රචාරය වීම සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ විමර්ශනයේ වාර්තාව” යන ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින්ම සකසා තිබෙන වාර්තාවේ ඇමුණුම් සහිත පිටපතක්

18. තීරණය ඉල්ලා සිටි දිනය - -

19. විශේෂිත කාල පරිච්ඡේදය තුළ අභියාචනය ඉදිරිපත් කර නැති නම් එම ප්‍රමාදය සඳහා හේතුව - -

20. මෙකී ගැටලුව සම්බන්ධයෙන් මීට පෙර කොමිෂන් සභාව වෙත අභියාචනයක් කර තිබේද? නැත

21. වෙනත් ඕනෑම විස්තරයක් - මාගේ ඉල්ලීම ගරු කතානායකතුමාගේ උපදෙස් මත ප්‍රතික්ෂේප කරන බව දැනුම් දෙමින් නම් කළ නිලධාරි විසින් 2025 දෙසැම්බර් 19 දිනැති ලිපියෙන් මට දැනුම් දුන්නාය.

i) කතානායකවරයා විසින් මහජන මුදල් අවභාවිතා කිරීමක් සිදු කර ඇත්නම් ඒ පිළිබඳ දැන ගැනීමට මහජනතාවට අයිතියක් ඇති බැවින් ද

ii) මෙම වාර්තාවේ අඩංගු වන්නේ කතානායකවරයාගේ නිල නිවස සම්බන්ධ තොරතුරු වැනි පාර්ලිමේන්තුවේ පරිපාලනය පිළිබඳ තොරතුරු මිස පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදක ක්‍රියාවලියට අයත් තොරතුරු නොවන බැවින් මෙම වාර්තාව ප්‍රසිද්ධ වීමෙන් 1953 අංක 21 දරණ පාර්ලිමේන්තුවේ (බලතල සහ වරප්‍රසාද) පනත උල්ලංඝණය නොවන බැවින් ද

iii) නම් කළ නිලධාරිට සිය තීරණය ගැනීමට ප්‍රශ්නගත සිදුවීමේ චූදිතයා වන කතානායකවරයා බලපෑම් කළ බව ඇමුණුම 4 ලෙස නම් කළ ලිපියේ “ගරු කතානායකතුමාගේ උපදෙස් පරිදි” යනුවෙන් සඳහන් වීමෙන් පෙන්නුම් කරන බැවින් ද

මාගේ ඉහත ඉල්ලීමට අදාළව පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා සහ නම් කළ නිලධාරියා විසින් ගත් තීරණ වෙනස් කරමින් ඉල්ලා ඇති වාර්තාව මා හට ලබා දෙන මෙන් පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරිට නියෝග කරන මෙන් ඉල්ලා සිටිමි.

21. අමුණා ඇති ලියකිවිලිවල ලැයිස්තුවක් -

ඇමුණුම 01 :- 2025 ඔක්තෝම්බර් 31 දිනැති ලිපිය - පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා වෙත එකී වාර්තාවේ පිටපතක් ඉල්ලා සිටිම.

ඇමුණුම 02 :- 2025 නොවැම්බර් 15 දිනැති ලිපිය - එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බව දැන්වීම.

ඇමුණුම 03 :- 2025 නොවැම්බර් 26 දිනැති ලිපිය - පාර්ලිමේන්තුවේ තොරතුරු දැන ගැනීම පිළිබඳ නම් කළ නිලධාරිට අභියාචනාවක් සිදු කිරීම.

ඇමුණුම 04 :- 2025 දෙසැම්බර් 19 දිනැති ලිපිය - මාගේ ඉල්ලීම ගරු කතානායකතුමාගේ උපදෙස් මත ප්‍රතික්ෂේප කරන බව දැනුම් දීම.

දිනය - 2025/01/06

අත්සන